

# හොඳ සිත් ඇත්තෝ ලොව ජය ගත්තෝ

ප්‍රථම මුද්‍රණය, 2010

සියලු හිමිකම් ඇවිරිණි.
© කුසුම් දිසානායක

ISBN 978-955-0335-12-1

(c) Sumitha Publishers

සුනීල නීලවාහිනී නදිය සේරිව රාජ්‍යය මැදින්
ගලා බැස්සේ වක ගැසෙමිනි.
එසේ වක ගැසෙමින්
තුන් පැත්තකින් නදියෙන් වට වූ බිම් කඩක
සේරිව රාජ්‍යයෙහි අගනුවර වූ අන්ධපුරය පිහිටියේය.

අන්ධපුරයෙහි බොහෝ සිටුවරු වූහ.

බොහෝ වෙළෙන්දෝ නිතර අන්ධපුරයට පැමිණ
වෙළ හෙළඳාමෙහි යෙදුණාහ.
මේ වෙළෙන්දෝ ඔරුවකින්
ගඟ තරණය කොට අන්ධපුරයට පිවිසුණාහ.
මේ හේතුවෙන් ගඟේ කීප තැනක ම
තොටු පොළවල් තිබිණ.



(c) Sumitha Publishers

සේරිවාණිජ හා කච්ඡපුට
සේරි රාජ්‍යයෙහි විසූ වෙළෙන්දෝ දෙදෙනෙකි.
ඔවුන් දෙදෙනා ම වෙළඳාම් කළේ
මාල, වළලු, පා පළඳනා ආදී ආභරණ ය.

එක් දිනක මේ වෙළෙන්දෝ දෙදෙනා
නීලවාහිනී ගං තෙර තොටු පොළක දී මුණ ගැසුණාහ.
"කච්ඡපුට අද අන්ධපුරයට යන්ට වගෙයි"
සේරි වෙළෙන්දා කීවේය.
"ඔව් මගෙ මේ පළඳනා ටික විකුණා ගන්න" යැයි
කච්ඡපුට පිළිතුරු දුන්නේය.
"මාත් යන්නේ පළඳනා විකුණන්න තමයි.
නමුත් අපි දෙන්නා ම එකට ගියොත් පාඩු යි." සේරි කීවේය.
"අපි දෙන්නා දෙ පැත්තකට යමු.
සේරි දකුණට යන්න. මම උතුරට යන්නම්."
කච්ඡපුට කීවේය.
"නෑ නෑ මම යි උතුරට යන්නේ.
ඒ පැත්තෙ තමයි ලොකු සිටුවරු ඉන්නෙ"
සේරි කීවේය.
"හොඳයි එහෙනම් මම දකුණට යන්නම්"
කච්ඡපුට එකඟ විය.

(c) Sumitha Publishers

